#mediaethicsSL #SinhalaPress #lka #SathiAgaAruna

ජනමාධ්‍යවේදියෙකු තමන් සමාජගත කරනා කරුණු කාරණා වල නිරවද්‍යභාවය සම්බන්ධයෙන් සැලකිලිමත් වනවා හා සමානවම, තමන් විසින් සමාජගත කරනා අදහස් කෙතරම් ඉදිරිගාමීද නැතිනම් පසුගාමීද යන්න පිළිබඳවද විශේෂයෙන් උනන්දු වීම අත්‍යාවශ්‍ය වේ. එසේ උනන්දු විය යුත්තේ මන්දැයි පෙන්වා දීම සඳහා සති අග අරුණ පුවත්පතේ පහත දැක්වෙන ලිපිය උදාහරණයක් ලෙසින් ගත හැක.

මෙහිදී මාධ්‍යවේදියා විසින් දක්වා සිටින කරුණක් වන්නේ, කාන්තා සනීපාරක්ෂක තුවා පැකට්ටු අවට සිටින සැම දෙනාටම පෙනෙනා ලෙසින් කවුන්ටරයේ තබා ඉන් පසුව මුදල් ගෙවීම යනු සාම්ප්‍රදායික ගැමි සංස්කෘතික ආකල්පයන්ගෙන් පිට පැනීමක් ලෙසයි. එම අදහසේ අර්ථයක් තිබේද, සුපිරි වෙළඳසලකදී ඕනෑම භාණ්ඩයක් මිලදී ගැනීමේ ක්‍රියාදාමය සනීපාරක්ෂක තුවා සඳහාද වලංගු වීමේ ගැටළුව කුමක්ද යන්න සම්බන්ධයෙන්ද තර්ක කළ හැකි වුවත්, මෙම කොටසේ දැක්වෙන යටිපෙළ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කිරීම වටනේයි. මාධ්‍යවේදියා මෙයින් පවසන්නට උත්සාහ කරන්නේ කාන්තා සනීපාරක්ෂක තුවා යනු සමාජයේ සැඟවිය යුතු භාණ්ඩයක් බව සහ ඒවා භාවිතා කිරීම සැඟවිය යුතු කරුණක් බවද? නැතහොත් කාන්තා සනීපාරක්ෂක තුවා මිලදී ගැනීම වෙනත් අයෙකු විසින් දැකීම ලැජ්ජාවට කරුණක් බව කීමටද? ලිපියේ මෙම කොටසින් ගම්‍ය වන්නේ එවන් අදහසක් නම්, එය ඉතාමත් පසුගාමී අදහසක් නොවන්නේද? එසේනම් එවන් පසුගාමී අදහස් සමාජගත කිරීම, යහපත් ජනමාධ්‍යවේදියෙකුගේ වගකීමෙන් අපගමනය වීමක් නොවේද?

මීට අමතරව මෙම ලිපිය සඳහා යොදාගෙන ඇති ඡායාරූප සම්බන්ධයෙන්ද පැනයක් නැගීමට අපි කැමැත්තෙමු. මෙම ඡායාරූප ලබාගෙන ඇත්තේ එහි සිටිනා පුද්ගලයින්ගේ අනුදැනුම ඇතිවද? එසේ නොවේ නම් එය මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් නොවේද?

මෙම කරුණු සම්බන්ධයෙන් ඔබේ අදහස් මොනවාද?